**වෘත්තීය අංශය** - කෘෂිකාර්මික හා කිරි ආශ්‍රිත

**උප අංශය** - කෘෂිකාර්මික / සත්ව පාලන ආශ්‍රිත නිශ්පාදන / යන්ත්‍රෝපකරණ

**වෘත්තීය නාමය/ රැකියාව** -
කිරි දොවන යන්ත්‍ර ක්‍රියාකරු

**වෘත්තීය/රැකියා විස්තරය**
"කිරි දොවන යන්ත්‍ර ක්‍රියාකරු" ප්‍රධාන කාර්‍යභාරයවන්නේ ගබඩා ටැංකියේ උෂ්ණත්වය හා කැලතීම පවත්වා ගනිමින් අවශ්‍ය ප්‍රමිතියට අනුකූලව ගුණාත්මකව කිරි සතුන්ගෙන් කිරි යාන්ත්‍රිකව ලබා ගැනීම සඳහා නිර්මාණය කර ඇති යන්ත්‍ර ක්‍රියාත්මක කිරීම සහ පාලනය කිරීමයි.

**වෘත්තීය/රැකියා රාජකාරි** –

- පෞද්ගලික සනීපාරක්ෂාව පවත්වා ගැනීම
- කිරි දොවන යන්ත්‍රයේ හා නල මාර්ග සවි කිරීමේ දී සෞඛ්‍යාරක්ෂිත තත්ත්වය පවත්වා ගැනීම
- ගබඩා ටැංකියේ සෞඛ්‍යාරක්ෂිත තත්ත්වය පවත්වා ගැනීම
- වැඩ කරන ප්‍රදේශයේ සනීපාරක්ෂක තත්ත්වය පවත්වා ගැනීම
- කිරි ලබා ගන්නා සතුන් පිරිසිදු කිරීම හා රැකබලා ගැනීම
- කිරි දොවන සතුන් කිරි දෙවීම සඳහා සූදානම් කිරීම
- කිරි දොවන යන්ත්‍රය ක්‍රියාත්මක කිරීම
- කිරි දොවන යන්ත්‍ර පිරිසිදු කිරීම හා පවත්වාගෙන යාම.

**මසකට අපේක්ෂිත ආදායම**
රු. 35,000.00 – 45,000.00

**වැඩ පරිසරය**
මෙය කර්මාන්තශාලා/ වැඩබිම්වල ගොවිබිම් වල සිදුවිය හැකිය.

**පවතින වෘත්තීය මාර්ග**
ජාතික වෘත්තීය සුදුසුකම් (NVQ) 2 වන මට්ටම සහ රැකියාවට ඇති අදාලත්වය



**අවශ්‍ය නිපුණතා / ගුණාංග සහ පුහුණුව**
මූලික සුදුසුකම් හා හැකියාව

**රැකියා අවස්ථා පවතින ප්‍රදේශ - රජය / පුද්ගලික / ස්වයං**
ගොවිපල ආශ්‍රිතව හා ඒ ආශ්‍රිත කර්මාන්ත පවත්නා ග්‍රාමීය ප්‍රදේශ හා විදේශීය ගොවිපලවල

**වෘත්තීය/රැකියාව සඳහා ප්‍රවේශ සුදුසුකම්**
කියවීමේ හා ලිවීමේ හැකියාව හා ශාරීරික යෝග්‍යතාවය

**පවතින පුහුණු මාර්ග**
NVQ 3 සහ ඉන් ඉහළ

**පවතින දේශීය රැකියා ගණන (පෙර වර්ෂයේ)**
100

**රැකියා අවස්ථා පවතින කලාප හෝ රටවල්**
ලංකාවේ කිරි ගොවිපල ආශ්‍රිත සියලුම ප්‍රදේශ හා විදේශීය රැකියා අවස්ථා



රැකියාස්ථ පුහුණුව
ගොවිපලවල් තුළ මාස 6

**වෘත්තීය / රැකියා සම්බන්ධ ගැටළු නිරාකරණය සඳහා වෙබ් සබැඳි / යූ ටියුබ් / වීඩියෝ / ප්‍රවීණයන්**

www.tvec.gov.lk, www.youthjobs.lk කිරි ගොවිපල ආශ්‍රිත යන්ත්‍රෝපකරණ හැසිරවීම සම්බන්ධ වීඩියෝ

**වැඩිදුර තොරතුරු සඳහා -**

- පුහුණු පාඨමාලා ක්‍රියාත්මක පුහුණු ආයතන සහ ව්‍යාපෘති මාර්ගෝපදේශන නිළධාරින් , නිපුණතා නිළධාරීන් හමුවී සාකච්ඡා කරන්න.
- බ්‍රිතාන්‍ය ප්‍රමිති සංගමය (BS) අනුමත ප්‍රමිතීන්

**කිරි දොවන යන්ත්‍ර ක්‍රියාකරුවෙකු වන්නේ කෙසේද?**

අනුමත පුහුණු මධ්‍යස්ථානයක කිරි දොවන යන්ත්‍ර ක්‍රියාත්මක කිරීම හා නඩත්තු කිරීම, පිළිබඳ නිපුණතා පාදක පුහුණු (**CBT**) , කර්මාන්තගත පුහුණු පාඨමාලාව හැදෑරීමෙන්

ජාතික වෘත්තීය සුදුසුකම ප්‍රදානය කෙරෙන පාඨමාලාවක් හැදෑරීම සහ අදාළ වෘත්තීය සුදුසුකම ලබා ගැනීම

- ක්‍රියාකරු විසින් හිමිකරුගේ පරිශ්‍රයට /ගොවිපොළට වාර්තා කළ යුතු අතර ගිවිසුමට අනුව වැඩ කළ යුතුය.



**රැකියා අවස්ථා සොයා ගන්නේ කෙසේද?**

දේශීය මට්ටමින් කිරි සහ කිරි නිෂ්පාදනය දිරිමත් කිරීම සඳහා රජය විසින් ධනාත්මක ප්‍රතිපත්ති සම්පාදනය කිරීම යටතේ කිරි යන්ත්‍ර ක්‍රියාකරුගේ රැකියාව ඉහළ ඉල්ලුමක් හා ලාභදායී රැකියාවක් බවට පත්වෙමින් තිබේ. එබැවින් හොඳින් පුහුණුව ලත් කිරි දොවන යන්ත්‍ර ක්‍රියාකරුවකුට රැකියා අවස්ථා රජයේ හා පෞද්ගලික කිරි ගොවිපොළවල දක්නට ලැබේ.